
ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසලොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව



"ධම්මෝ හවේ රකඛති ධම්මචාරී"

71 වර්ෂය - ශ්‍රී බු.ව 2560 2016 ජුනි 19 පොසොන් කලාපය

ශ්‍රාස්ත්‍රපති උරුගමුවේ අස්සජි හිමි

ජීවිතයට ඔවදනක්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

යං බො බ්‍රාහ්මණ ආරම්භධාතුයා සති ආරම්භ වන්තෝ සත්තා පඤ්ඤායන්තී'ති අයං සත්තානං අත්තකාරෝ , අයං පරකාරෝති

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ අත්ථි නික්ඛමධාතු අත්ථි පරක්කමධාතු අත්ථි ථාම ධාතු අත්ථි ඨිති ධාතු අත්ථි උපක්කමධාතු'තී

එවම්හො උපක්කමධාතුයා සති උපක්කමවන්තෝ සත්තා පඤ්ඤායන්තී'ති

(අත්තකාර සුත්‍රය, අංගුත්තර නිකාය)

අපි මිනිසුන් වශයෙන් මෙලොව උපත ලබා ඇත්තෙමු. ඒ සසර අපමණ කුසල් රැස්කර ගත් නිසාවෙනි. නො එසේ නම් අප උපත ලබනුයේ තිරිසන් ගත ජන්මයන්හිය. මෙසේ මිනිසුන් ලෙස උපත ලැබූ අපි සෙසු සියලු සත්ත්ව වර්ගයා සේම මොහොතින් මොහොත මරණය කරා ළඟා වන්නෙමු. මිනිසෙකුගේ පරම ආයුෂ වසර 120 ක් ලෙස සම්මතව පැවතිය ද නූතන සමාජය තුළ එපමණ කලක් ජීවත්වන්නෝ නොවෙති. ඉකුත් 2000 වසර උදාවීමට පෙර නව සහස්‍රකය උදාවන්නේ යැයි, මාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරයක් දියත් කෙරිණ. එය අද ඊයේ මතකයක් මෙන් අප සිත් තුළ පැවතිය ද දැනට එය සිදු වී වසර 15ක්ම ඉකුත් වී ඇත. ගිහි පැවිදි බොහෝ දෙනෙකු ගත කරන පෙර මිනිසුන් තුළ නොවූ විරූ අන්දමේ අධික කාර්යබහුල ජීවන රටාව නිසා කාලය නොදැනුවත්ම සේ ඉකුත්ව යන ස්වාභාවයක් පෙන්නුම් කෙරෙයි.

මිනිසුන් ලෙස සසර එක් භවයක් තුළ ගත කරන මෙම ඉතා කෙටි කාල සීමාව තුළ ජීවිතය මෙලොව හා පරලොව වශයෙන් ජය ගැනීම සඳහා අපි අනේකවිධ වූ ක්‍රියාකාරකම් වල නිරත වන්නෙමු. එයින් මෙලොව ජීවිතය ධාර්මික ලෙස ජයගැනීම යනු පරලොව ජීවිතය ද ජය ගැනීමක් බව අප හොඳින් දන්නා කරුණකි. එලෙස මෙලොව ජීවිතය සාර්ථකව ජයගැනීම සඳහා සිදු කරන කිසියම් යහපත් කාර්යයක් ආරම්භ කොට ඉදිරියට පවත්වාගෙන යාමේ දී එහි සාර්ථකත්වය සඳහා පියවර සයක් අනුව ගමන් කළ යුතු බව **අත්තකාර සූත්‍රයේ** සඳහන් වී තිබේ. ඉන් පළමුවැන්න ආරම්භ ධාතු ලෙස දැක්වේ. එහි අර්ථය ක්‍රියාව ඇරඹීමයි. ආරම්භ කළ ක්‍රියාව ඉදිරියට පවත්වාගෙන යාම දෙවැන්නයි. තෙවැන්න බාධා මැඩගෙන යාමයි. නොසැලී පැවතීම සිව්වැනි කරුණ වන අතර වීර්යයෙහි පිහිටා සිටීම පස් වැනි කරුණයි. අවසානයට ඉගැන්වෙනුයේ උපක්‍රමශීලි වීමයි.

යහපත් කටයුත්තක් සඳහා මෙම පියවර සය නිවැරදිව ක්‍රියාත්මක කරන්නේ නම් කිසිදු කාර්යයක් අතරමග නතර කර දැමීමට සිදු නොවේ. පුද්ගල ශ්‍රමය වැය කිරීමේ දී බාහිර බලවේග පිළිබඳ විශ්වාසය නොතබා ස්වකීය ශක්තියම යෙදවීමට කරන උත්සාහයක් මෙමගින් අදහස් වෙයි. මෙහි දී යහපත් ක්‍රියාවක් ඇරඹීම පළමු කාර්යයි. යමක් කිරීමේදී පළමුව ඇතිකර ගන්නා වීර්යය එම ක්‍රියාවෙහි සාර්ථකත්වය සඳහා අතිශයින්ම ඉවහල් වෙයි. නිදසුනක් ලෙස ''සොත්ථිය'' නමැති බමුණෙකු පිදූ කුස තණ අතුරා අසුනක් පනවා ගත් බෝසතාණන් වහන්සේ ඇති කර ගත් චතුරංග සමන්නාගත වීර්යය දැක්වීය හැකිය. ''මාගේ ශරීරයේ ඇට, සම්, නහර පමණක් ඉතිරි වන සේ මස්, ලේ වියලි ගිය ද සම්බුද්ධත්වයට නොපැමිණ මේ ආසනයෙන් නැගි නො සිටිමි.'' යනු එම අධිෂ්ඨානයයි.

එබැවින් තමන් පටන් ගත් යහපත් කාර්යය සාර්ථකත්වයට පත් කර ගැනීමට නො ලැබෙන පරිදි සිය දහසක් බාධා පැමිණියද ඒවා තණ පතක් තරමටවත් ගණන් නොගෙන වීර්යයෙන් දිගින් දිගටම පවත්වාගෙන යාම ධෛර්ය සම්පන්න උතුම් පුද්ගලයින් ගේ සිරිතක් බව නිතර මෙනෙහි කළ යුතුය. වීර්යයක් නොමැතිව කිසිවෙකුට වත් කිසියම් කාර්යයක නිසි පල නෙලාගත නොහැකිය.

මෙලොව ඇතැමුන් ජීවත්වනුයේ කිසිදු පැහැදිලි අරමුණක්, බලාපොරොත්තුවක් නැතිවය. ඔවුහු දුර්ලභ වූ මිනිසත් බවෙන් නියම පල නොලබති. එහෙත් නුවණැත්තා සෑම විටෙකම නොපසුබස්නා වීර්යයෙන් ක්‍රියා කරයි. කෙතෙක් බාධා පැමිණියත් ස්වකීය ක්‍රියාව ඉදිරියට පවත්වා ගෙන යයි ඔහුට ඕනෑම දියුණුවක් සලසා ගත හැකිය. එබැවින් කුඩා කාලයේ සිටම ඇති කරගත යුත්තේ නොපසුබස්නා වීර්යයයි. යම් යහපත් ක්‍රියාවක් ආරම්භ කොට එය බාධා මැඩගෙන ඉදිරියට පවත්වා ගෙන යාමේ දී නොසැලී සිටීම ද අත්‍යවශ්‍යය.

උපක්‍රමශීලිව ක්‍රියා කිරීමට හුරුවීම ද ඉතා අගනේය. උපායෙහි දක්ෂ බව ද දියුණුවට අවශ්‍ය දෙයකි. **"උපාය දන්නෝ අපායේ නො වැටෙති"** යන සිංහල ප්‍රස්ථාව පිරුළ ඇති වන්නට ඇත්තේ ද ඒ නිසා විය යුතුය. මෙහි උපාය යනු වැරදි උපාය මාර්ග නොවේ. නිවැරදි උපායයි. උපායෙහි දක්ෂව ක්‍රියා කොට ඉතා සුලු දෙයකින් පවා දියුණු විය හැකි බව මළ මී කුණක් විකුණා ක්‍රමයෙන් දියුණුවට පත් පුද්ගලයෙකු අවසානයේ දී සිටුවරයෙකු වූ ආකාරය විස්තර වන **"චුල්ලසෙට්ඨී"** ජාතකයෙන් පැහැදිලි වේ.

අධ්‍යාපනය ඇතුළු සෑම කාර්යයක්ම සාර්ථක කර ගැනීමට දැඩි වීර්යයක් තිබිය යුතු බව පැහැදිලිය. වීර්යය ඇති අයට ලැබිය නොහැකි නුවණක්, නොලැබිය හැකි සැපතක් නැත. බොහෝ දෙනා දුක් අඩු සැපවත් ජීවිතයක් ගෙන යන්නේ වීර්යය හේතුවෙනි. ලොව මහා නුවණැත්තන් වන්නේ අලසයන් නොව නොපසුබට වීර්යයෙන් ක්‍රියා කරන අයයි.

අලසකම කෙනෙකු තුළ පවත්නා වීර්යය අවම කිරීමට හේතුවක් වේ. අලසකමින් තොරව අද කළ යුතු දේ අදම කිරීම ඉතා හොඳ පුරුද්දකි. එවිට වැඩ ගොඩ ගැසීමක් සිදු නොවේ. එහෙත් අලසකම නිසා සිදුවන්නේ අද කළ යුතු දේ හෙටට කල් දැමීමයි. එවිට හෙට වැඩ අධික වනු ඇත. මෙසේ ක්‍රමයෙන් දිනපතාම වැඩ කටයුතු අවුල් වෙයි. ක්‍රියාව ආරම්භ කළ ද එය ඉදිරියට පවත්වා ගෙන යාම නිසි ආකාරව සිදු නො කිරීම එයට හේතුවයි. යහපත් ක්‍රියාව මනා ඇරඹුමකින් යුක්තව බාධා මැඩගෙන ඉදිරියට පවත්වා ගෙන යාම වඩාත්ම හරවත් පිළිවෙතය. මෙහි දී සෑම විටෙකම "පසුබට නොවන්න, ඉදිරියටම එන්න" යන බුද්ධ දේශනාව සිහි කිරීම අපට බෙහෙවින්ම වැඩදායකය.

මේ අනුව යම්කිසි කාර්යයක් ආරම්භ කොට ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා වීර්යය අවශ්‍ය බව මනාව පැහැදිලිය. බාධා මැඩගෙන නොසැලී ස්වකීය යහපත් කාර්යයන් ඉදිරියට පවත්වා ගෙන යාම සිදු කළ යුතුය. විවිධාකාර බාධක හමුවේ පීඩනයට පත් නොවී දිගින් දිගටම ඒ ඒ යහපත් ක්‍රියාවන් කරගෙන යාම වීර්යවන්තයාගේ ක්‍රියා පිළිවෙතයි. ඔහු එමගින් බලාපොරොත්තු වන ඉලක්කය කරා ක්‍රමයෙන් ළඟාවෙයි.